සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය - 2017 | 06 ශ්‍රේණිය
Second Term Test – 2017 | Grade 06

ගණිතය I
Mathematics I

පැය දෙකයි
Two Hours


## I කොටස

සැලකිය යුතුයි :

- I කොටසේ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


---

(1) සුළු කරන්න. 498 + 275 = ............................................

(2) 


මෙම රූපයේ අඳුරු නොකළ කොටස මුළු රූපයෙන් කිනම් භාගයක්ද?

............................................

(3) 


ඔබගේ පාසල ආරම්භ කරන වේලාව දෙන ලද ඔරලෝසු මුහුණතෙහි ඇඳ දක්වන්න.

(4) කමල් මහතාගේ ජුනි මාසයෙහි වැටුප රු. 27 640.00 කි. ඔහුගේ සම්පූර්ණ වියදම රු. 18 500.00 කි. ජුනි මාසයෙහි ඔහුගේ ඉතිරිවන මුදල සොයන්න. ............................................

(5) 


දී ඇති රූපයෙහි a කුමන වර්ගයේ කෝණයක්ද?

(6) 0.05 මෙම දශම සංඛ්‍යාව කියවන ආකාරයෙන් ලියන්න.

............................................ ............................................

(7) රටාව තේරුම් ගෙන හිස්තැනට සුදුසු අගයයන් යොදන්න.

1 , 4 , 9 , ............... , ...............

(8) කසුනි පළමු වාර පරීක්ෂණයේ විද්‍යාව හා ගණිතය විෂයයන් සඳහා ලබා ගත් ලකුණු පිළිවෙලින් 47 හා 63ක් විය . ඇය ලබා ගත් ලකුණු 10ට වටයා ලියන්න.

විද්‍යාව - ........................................ ගණිතය - ........................................

(9) 87 × 100 = ........................................ අගය සොයන්න.

(10) පැය 1යි මිනිත්තු 35, මිනිත්තු කීයද? ........................................

(11) සුළු කර පිළිතුර ලබා ගන්න.

$$\begin{array}{r} 4.35 \\ +\ 1.8 \\ \hline \\ \hline \end{array}$$

(12) සනත් පළමු වාර පරීක්ෂණයේ දී ගණිතය විෂය සඳහා ලබා ගත් ලකුණු ආසන්න 10 ට වටයූ විට 80 ක් විය. ඔහු ලබා ගත්තේ යැයි අපේක්ෂා කළ හැකි,

i. අඩුම ලකුණු සංඛ්‍යාව කීයද? .........................................

ii. වැඩිම ලකුණු සංඛ්‍යාව කීයද? .........................................

(13) හිස්තැන් පුරවන්න.

| | භාග සංඛ්‍යාව | දශම සංඛ්‍යාව |
|---|---|---|
| i | $\frac{7}{10}$ | |
| ii | | 0.27 |

(14) අවුරුදු උත්සවයක් සඳහා එක් ක්‍රීඩකයෙකු මැරතන් ධාවන තරගයක් සඳහා දිවිය යුතු මුළු දුර 2500 m ක් නම් ක්‍රීඩකයක් 10 දෙනෙක් දිවිය යුතු මුළු දුර km වලින් නිමානය කරන්න. .........................................


(15)



375ml

ලීටර් 1.5 ක බීම බෝතලයකින් සිසුන් කීපදෙනෙක් බී ඉතිරි වූ ප්‍රමාණය 375 *ml* කි. සිසුන් බී ඇති බීම ප්‍රමාණය කොපමණ ද?

(16)




පහත රූප සටහනේ A හා B මගින් නිරූපණය වන තල රූප වල නම් ලියන්න.

A = ................................


B = ................................

(17) $\frac{1}{4}$ , $\frac{1}{2}$ , $\frac{3}{8}$ භාග සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට සැකසූ විට අවසානයට යෙදෙන භාගය (විශාලම භාගය) කුමක්ද?

(18) පහත දැක්වෙන දශම සංඛ්‍යා අවරෝහණ පිළිවෙලට ලියන්න.


0.5 , 0.25 , 1.5 , 0.15

(19)




හිස්තැන් සඳහා සුදුසු අගයන් සොයන්න.

(20)



මෙහි දැක්වෙන්නේ ක්‍රීඩා පිටියක අඳින ලද ධාවන පථයකි. එය සරල රේඛීය තල රූපයක් වේ ද? නොවේ ද? හේතු දක්වන්න.

.....................................................................................

.....................................................................................

# II පත්‍රය

සැලකිය යුතුයි :

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01) හිස්තැන් සම්පූර්ණ කරන්න.

i. a) $\frac{6}{8} = \frac{\square}{4}$ (ල. 01)

b) $\frac{7}{11} - \frac{3}{11} = \frac{\square}{\square}$ (ල. 01)

ii. අගය සොයන්න. $\frac{1}{6} + \frac{2}{3}$ (ල. 03)

iii. < , > , = ලකුණු යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

$\frac{3}{4}$ ........................ $\frac{7}{8}$ (ල. 02)

iv. පියෙක් තම වැටුපෙන් $\frac{1}{2}$ ක් ආහාර සඳහා ද $\frac{1}{3}$ ක් අධ්‍යාපන කටයුතු සඳහා ද වියදම් කරයි. ආහාර සඳහා අධ්‍යාපනයට වඩා කොපමණ භාගයක් වැය කර තිබේ ද? (ල. 03)

02)

i. රටාව හඳුනාගෙන ඊළඟ පදය සොයන්න.


a) 1 , 3 , 5 , 7 , ⟶ .........................

b) 7 , 10 , 13 , 16 , ⟶ .........................

c) 1 , 4 , 9 , 16 , ⟶ ......................... (ල. 03)

ii. 10ත් 20ත් අතර ඇති ප්‍රථමක සංඛ්‍යා 3ක් ලියන්න.

iii.



1 3 6 , ........................ (ල. 03)

ඉහත ත්‍රිකෝණ සංඛ්‍යා රටාව අනුව ඊළඟ රටාව ඇඳ , ඉන් නිරූපිත සංඛ්‍යාව සොයන්න. (ල. 03)

iv. දී ඇති සම්බන්ධතාවය හඳුනාගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න.

1 = 1

1 + 3 = 4


1 + 3 + 5 = 9

[1] + □ + □ + □ = 16

(ල. 03)

03)


i. හිස්තැන් සම්පූර්ණ කරන්න.




(ල. 03)

ii. ඉහත දැක්වෙන සම්බන්ධතා අනුව 36 හි සාධක සියල්ලම ලියන්න. (ල. 03)

iii. ගැළපෙන පරිදි යා කරන්න.





(ල. 03)

iv. ඉහත සංඛ්‍යා අතරින් ඔත්තේ සංඛ්‍යා තුනක් තෝරා ලියන්න. (ල. 03)


04)

i. 342 107 289 සංඛ්‍යාවේ 2න් නිරූපණය වන අගයන් ලියන්න. (ල. 01)



(ල. 01)

ii.





ඉහත සංඛ්‍යා රේඛාවේ A හා B මගින් නිරූපණය වන සංඛ්‍යා දෙක ලියන්න.

A = ............................................ B = ............................................

(ල. 02)

iii. 2456789300 මෙම සංඛ්‍යාව කලාප වලට වෙන් කර සංඛ්‍යා නාමය ලියන්න.

iv.




1. මෙම ගණක රාමුවෙන් නිරූපිත සංඛ්‍යාව ලියන්න.

2. එහි දෙවන කුරෙන් නිරූපිත අගය කුමක්ද?

(ල. 03)

v. සුදුසු සංඛ්‍යාවක් යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

8 , (-3) , 2 , 0 , (-7) ,

(-5) > ........................ (ල. 02)


05)

i. සෙන්ටි මීටර වලින් අගය සොයන්න.

2m = ..........................cm

1m 20cm = ................. cm

½ m = ........................ cm (ල. 03)

ii. 


දී ඇති තොරතුරු අනුව පරිමිතිය සොයන්න. (ල. 03)

iii. සෘජුකෝණාස්‍රයක දිග , පළල මෙන් තුන් ගුණයකි. එහි දිග 48cm නම්

a) පළල සොයන්න. (ල. 02)


b) පරිමිතිය සොයන්න. (ල. 02)

iv. සුළු කරන්න.

| | cm | mm |
|---|---|---|
| | 18 | 6 |
| + | 43 | 5 |
| | | |

(ල. 02)

06)

i. 


උතුරු දිශාවත් බටහිර දිශාවත් අතර ඇති දිශාවට ප්‍රතිවිරුද්ධ දිශාව කුමක්ද? (ල. 02)

ii. පහත දැක්වෙන දේවල් පොදු ලක්ෂණ අනුව කාණ්ඩ දෙකකට වෙන් කර ලියන්න.

(කාරය , නැව , පාරුව , ලොරිය , ඔරුව , ට්‍රැක්ටරය)

| A | B |
|---|---|
| | |
| | |
| | |

(ල. 04)

iii. සුදුසු පරිදි හිස්තැන් සම්පූර්ණ කරන්න.

$2l\ 750\ ml$ = ......................................... $ml$

............... $l$ ...................$ml$ = 4 087 $ml$ (ල. 03)

iv. 20 ත් 30 අතර ඇති සංඛ්‍යා අතරින් පහත සඳහන් සංඛ්‍යා කාණ්ඩ වලට සුදුසු සංඛ්‍යා දෙක බැගින් ලියන්න.


| | | |
|---|---|---|
| .............................................<br>.............................................<br>ඔත්තේ සංඛ්‍යා | .............................................<br>.............................................<br>ඉරට්ටේ සංඛ්‍යා | .............................................<br>.............................................<br>ත්‍රිකෝණ සංඛ්‍යා |

(ල. 03)

07)


i. ඝනකයක් සෑදීම සඳහා සුදුසු පතරොමක් ඇඳ දක්වන්න. (ල. 03)

ii.



a) ඉහත දැක්වෙන ඝන වස්තුවේ නම කුමක්ද? .............................................
b) මුහුණත් වල හැඩයන් හඳුන්වන නම කුමක්ද? .............................................
c) එහි ඇති ශීර්ෂ ගණන කීයද? .............................................
d) එහි ඇති දාර ගණන කීයද? ............................................. (ල. 04)

iii.



මෙම වෘත්ත රටාවෙහි ඇති වෘත්ත ගණන කීයද?

iv. වෘත්තාකාර හැඩයන් සහිත ද්‍රව්‍යයක් ලෙස බිත්තරය ගත හැකි බව නීල් පවසයි. එම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න.

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය - 2017
Second Term Test – 2017

06 ශ්‍රේණිය
Grade 06

ගණිතය I
Mathematics I

පැය දෙකයි
Two Hours

## I කොටස - පිළිතුරු පත්‍රය

සැලකිය යුතුයි :

- I කොටසේ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. 773 (ල. 2)

ii. $\frac{5}{6}$ (ල. 2)

iii. සුදුසු නිවැරදි පිළිතුරකට (ල. 2)

iv.

$$\begin{array}{r} 27\ 640 \\ -\ 18\ 500 \\ \hline 9\ 140 \\ \hline \end{array}$$

(ල. 2)

v. මහා කෝණයකි. (ල. 2)

vi. බින්දුවයි දශම බින්දුවයි පහ (ල. 2)

vii. 16 , 25 (ල. 2)

viii. විද්‍යාව - 50 , ගණිතය - 60 (ල. 2)

ix. 8700 (ල. 2)

x. මිනිත්තු 95 (ල. 2)

xi. 6. 15 (ල. 2)

xii. අඩුම ලකුණ - 75 , වැඩිම ලකුණ - 84 (ල. 2)

xiii. 1) 0.7 2) $\frac{27}{100}$ (ල. 2)

xiv. 25 000 m , 25 km (ල. 2)

xv.

$$\begin{array}{rr} l & ml \\ 1 & 500 \\ - & 375 \\ \hline 1 & 125 \\ \hline \end{array}$$

(ල. 2)

xvi. A - සමචතුරස්‍රය
B - ත්‍රිපිරමිඩය (ල. 2)

xvii. $\frac{2}{8}$ $\frac{4}{8}$ $\frac{3}{8}$
විශාලම භාගය $\frac{1}{2}$ (ල. 2)

xviii. 1.5 , 0.5 , 0.25 , 0.15 (ල. 2)

xix. 4 සහ 2 (ල. 2)

xx. නොවේ
වක්‍රරේඛා ඇති නිසා (ල. 2)

# II පත්‍රය - පිළිතුරු පත්‍රය

01)

i. a) $\frac{6}{8} = \frac{3}{4}$ (ල. 02)

b) $\frac{4}{11}$ (ල. 02)

ii. $\frac{3}{6} + \frac{2}{6} = \frac{5}{6}$ (ල. 03)

iii. <

(ල. 02)

iv. $\frac{1}{2} - \frac{1}{3}$

$\frac{3}{6} - \frac{2}{6}$

$= \frac{1}{6}$ (ල. 03)


02)

i.

a) 9
b) 19
c) 25 (ල. 03)

ii. 11 , 13 , 17 , 19 (නිවැරදි පිළිතුරු 3 තකට ලකුණු 3)

iii.



රටාව (ල. 02)

සංඛ්‍යාව 10 (ල. 01)

iv. 3 , 5 , 7 (ල. 03)

03)

i. නිවැරදි පිළිතුරු 3 සඳහා ලකුණු 3

ii. 1 , 2 , 3 , 4 , 6 , 9 , 12 , 18 , 36 - සාධක තුනකට වඩා ලියා ඇත්නම් ල. 3 දෙන්න.

iii. ප්‍රථමක සංඛ්‍යා - 2 , 5, 7

සංයුක්ත සංඛ්‍යා - 4, 6, 9 (ල. 03)

iv. 5 , 7 , 9 (ල. 03)

04)

i. 200
2 000 000 (ල. 03)

ii. A= -20 A= 10 (ල. 02)

iii. 2 456 789 300
දෙබිලියන හාරසිය පනස් හය මිලියන හත්සිය අසූ නව දහස් තුන් සියය (ල. 03)

iv. 3 042
40 (ල. 03)

v. (-7) (ල. 02)

05)

i.
a) 200 cm
b) 120 cm
c) 50 cm (ල. 03)

ii. 8 + 12 + 8 + 12 = 40 cm (ල. 03)

iii.
a) 16 cm (ල. 01)
b) (16 ×2) + (48 ×2) = 128 cm (ල. 02)

iv. 62 cm 1 mm (ල. 03)

06)

i. වයඹ දිශාව
ගිණිකොණ දිශාව (ල. 03)

ii. A – කාරය , ලොරිය , ට්‍රැක්ටරය
B – නැව , පාරුව , ඔරුව (ල. 03)

iii. a) 2750 ml

b) 4l 84 ml (ල. 03)

iv. ඔත්තේ සංඛ්‍යා - 21 , 23 , 27 , 29 (නිවැරදි සංඛ්‍යා දෙකට ල. 1)
ඉරට්ටේ සංඛ්‍යා - 22 , 24 , 26 , 28 (නිවැරදි සංඛ්‍යා දෙකට ල. 1)
ත්‍රිකෝණ සංඛ්‍යා - 21 , 28 (නිවැරදි සංඛ්‍යා දෙකට ල. 1)

07)

i. සුදුසු පතරොමක් සඳහා (ල. 03)

ii.

a) ඝනකාභය
b) ඍජුකෝණාස්‍ර
c) 8
d) 12 (ල. 04)

iii. 12 (ල. 02)

iv. නැත

වෘත්තාකාර නොවන නිසා (ල. 02)